# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1557/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 11/12/2023 පැය 0815

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2023.12.10 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 23 | - | බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු සහ දේපල අදාළ පොලිසියට ඉදිරිපත් කර ඇත.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර.**

2023.12.10 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අගබෝපුර පොලිස් වසමේ ට්‍රැක් 22 ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අග්බෝපුර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන රජඇල, කන්තලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** වැඩිදුර විමර්ශන අග්බෝපුර පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබයි.

**03.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2023.12.10 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුත්තලම පොලිස් වසමේ කොට්ටුකච්චිය ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පුත්තලම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 63 ක් වන කොට්ටුකච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැඩිදුර විමර්ශන පුත්තලම පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබයි.

**04.** **නීති විරෝධී මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර.**

පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත 2023.12.10 වන දින රාත්‍රී කාලයේ උප්පුවේලි පොලිස් වසමේ සෙල්වනායගම්පුර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්කරල් 32 ක් සහ සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන උප්පුවේලි පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැඩිදුර විමර්ශන උප්පුවේලි පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබයි.

**05.** **කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කැළණිය කඳවුර.**

2023.12.10 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා කැළණිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පෑලියගොඩ පොලිස් වසමේ දුටුගැමුණු මාවත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **කේරළ ගංජා කිලෝග්‍රෑම් 02 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පෑලියගොඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 45ක් වන පෑලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැඩිදුර විමර්ශන පෑලියගොඩ පොලිස් ස්ථානය මඟින් සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**